ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

2026 මාර්තු මස 19 | ***චක්‍රලේඛ අංක : 22 /2026***

සියළු ම දිසා කොමසාරිස්වරුන් වෙත,

**<u>විශේෂ බාලදක්ෂ සංගණනය - 2026.01.31</u>**

උක්ත මාතෘකාවෙන් 2026 පෙබරවාරි 12 වන දිනැතිව ඔබවෙත එවූ චක්‍රලේඛ අංක 12/2026 හා බැඳේ. අදාල චක්‍රලේඛය අනුව ඇමුණුම් පෝරම 3 ක් සම්පූර්ණ කර එවිය යුතු ය.

ඇමුණුම 1 - A පෝරමය
ඇමුණුම 2 - B පෝරමය
ඇමුණුම 3 - C පෝරමය

මෙම පෝරම තුන පිරවීම සඳහා උපදෙස් සහිත පත්‍රිකාව ද මේ සමඟ අමුනා ඇත.

මෙහිදී A පෝරමය සෑම අංශයක් සඳහා ම ඇති එක් එක් සිහිති බාලදක්ෂ ගොමු, පෝතක බාලදක්ෂ රැලවල්,බාලදක්ෂ කණ්ඩායම් හා මානවක සමාජ අනුව වෙන වෙනම සකස් කොට පෝරම එවීමට කාරුණික වන්න.

පෙර දැනුම් දුන් පරිදි මෙම තොරතුරු එවීම 2026.02.28 වන දින ට නියමිත වුව ද පාසල් වාර නිවාඩු වෙනස්වීම,පාසල් පැවැත්වූ දින ගනන් අඩුවීම වැනි හාධක පැමිණි නිසා අදාල තොරතුරු ඒවීමේ කාලය දීර්ඝ කළ බව මෙයින් දන්වමි.ඒ අනුව උක්ත සංගණන පෝරම එවීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා 2026.03.31 වන දින ට පෙර පහත විද්‍යුත් ලිපිනය ඔස්සේ හෝ තැපෑලෙන් ශ්‍රී ලංකා බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කරන ලෙස දන්වමු.

***<u>මෙම තොරතුරු 2026.03.31 දින හෝ එදිනට ප්‍රථම පහත විද්‍යුත් ලිපිනය ඔස්සේ හෝ තැපෑලෙන් බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කළ යුතුය.</u>***
slsa.census@gmail.com

මෙම විශේෂ සංගණනය සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් කොමසාරිස්වරුන් සහ ස.දි.කො (පරිපාලන) ගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.

ස්තූතියි.
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**සම්පත් කාරියවසම්**
සහය ප්‍රධාන කොමසාරිස් (මූල්‍යය හා කළමණාකරන)

**නීතිඥ. මනෝජ් නානායක්කාර**
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත් - සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික
මූලස්ථානයේ සියළු ම කොමසාරිස්වරුන් ( කා.දැ.පි)
කාර්යාල ලිපි ගොනුවට

65/9
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

***<u>සංගණන තොරතුරු පිරවීම සඳහා උපදෙස්</u>***

මෙම සංගණන දත්ත පරිගණක ගත කිරීමට අපේක්ෂාකරණ හෙයින් නිවැරදි තොරතුරු අනුව ම පෝරම සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

- අදාළ දත්ත සහය දිසා කොමසාරිස් (පරිපාලන) ගේ අධීක්ෂණය යටතේ පිරවිය යුතු වේ.

❖ ඇමුණුම 1 - A පෝරමය

බාලදක්ෂ සමූහයන්හි සියළුම අංශ වල සිඟිති බාලදක්ෂ ගොමුවල,පෝතක බාලදක්ෂ රැළ වල් වල,බාලදක්ෂ කණ්ඩායම්වල හා මානවක සමාජ වල බාලක බාලිකාවන්ගේ තොරතුරු වෙන වෙන ම සම්පූර්ණ කර තම සමූහයන්හි සමූහ බාලදක්ෂ නායක / විදුහල්පති තුමා ගේ අනුමැතිය සහිතව, දිසා කොමසාරිස්තුමා මඟින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු වේ.

❖ ඇමුණුම 2 - B පෝරමය

බාලදක්ෂ සමූහයන්හි සියළුම අංශ වල සිඟිති, පෝතක, බාලදක්ෂ හා මානවක බලපත්‍රධාරී නායක නායිකා හා සහය බාලදක්ෂ මහත්ම මහත්මීන් (2026 වසරට අධිකාරීපත්‍ර නවීකරණයට අයදුම් කළ සහ අළුතින් අධිකාරීපත්‍ර අයදුම් කළ සිඟිති, පෝතක, බාලදක්ෂ හා මානවක නායකනායිකාවන්) තොරතුරු ආශ්‍රයෙන් සම්පූර්ණ කර තම සමූහයන්හි සමූහ බාලදක්ෂ නායක/විදුහල්පති තුමාගේ අනුමැතිය සහිතව දිසා කොමසාරිස් තුමා මඟින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු වේ.

❖ ඇමුණුම 3 - C පෝරමය

සංගණන භාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පුරවා, දිසා කොමසාරිස් තුමා මගින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත එවිය යුතු ය.

සැ.යු. පෙර එවූ උපදෙස් පත්‍රිකාවේ අවසාන ඇමුණුම, ඇමුණුම B පෝරමය ලෙස දක්වා ඇති අතර එය ඇමුණුම C පෝරමය ලෙස නිවැරදි විය යුතු බව ද සඳහන් කරමු.